හිතවත් බැංකු ගනුදෙනුකරුවනි,

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද පාරිභෝගික ප්‍රඥප්තිය යටතේ දැක්වෙන නියමයකට අනුව, අපගේ බැංකුව විසින් මූලික කරුණු අන්තර්ගත ලේඛන (Key Fact Documents) මාලාවක් සකස් කර ඇති අතර. ඔබට අවශ්‍ය වන සහ ඔබට සුදුසු වන පරිදි අපගේ බැංකුව විසින් සපයන බැංකු ගිණුම් පහසුකම්/සේවාවන් තෝරාගැනීම පිණිස ඔබට සහාය වීමට එකී ලේඛන මාලාවෙන් අපේක්ෂා කරනු ලැබේ.

පෞද්ගලික බැංකු කටයුතු සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් හි තිබෙන ගිණුම් ආශ්‍රිත සුවිශේෂ පැකේජ සහිත විවිධ වර්ගයේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් පිළිබඳව සහ පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පිළිබඳව පුළුල් සංක්ෂිප්ත විස්තරයක් මෙම මූලික කරුණු අන්තර්ගත ලේඛනයෙන් ඔබ වෙත සපයනු ලැබේ.

කෙසේ වුව ද, මෙම මූලික කරුණු අන්තර්ගත ලේඛනයේ සඳහන් කාරණාවන් නෛතික සහ නියාමන වෙනස්කම්වලට අනුව සහ අපගේ බැංකුවේ ප්‍රතිපත්තිවල සහ කාර්ය පටිපාටිවල සිදුවන වෙනස්ම්වලට අනුකූලව ප්‍රතිශෝධනය වීමක් අවශ්‍ය වියහැකි බව කරුණාවෙන් සලකන්න.

මේ පිළිබඳව වැඩිමනත් තොරතුරු ලබාගැනීමට ඔබ අපේක්ෂා කරන්නේ නම්, කරුණාකර www.nationstrust.com වෙබ් අඩවියට පිවිස හෝ 0114 711 411 දරන දුරකථන අංකයෙන් හෝ පැය 24 පුරා ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථානය ඔස්සේ අප බැංකුව ඇමතීමට කාරුණික වන්න.

පහත සඳහන් ඔබගේ යම් කවරම වූ ගිණුමක් සම්බන්ධයෙන් යම් කවරම වූ පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට ඔබට ඇත්නම්, එම පැමිණිල්ල පිළිබඳ දැන්වීම අඩංගු ලුහුඬු ලිඛිත ප්‍රකාශයක් අප බැංකුවේ ;

**පැමිණිලි විසඳීමේ නිලධාරී, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී, අංක 242, යුනියන් පෙදෙස, කොළඹ 02** යන ලිපිනයට භාරදීමෙන් හෝ දුරකථන අංක **[+94(0)11 4711411]** ඔස්සේ අප ඇමතීමෙන් හෝ customersesrvice@nationstrust.com යන විද්‍යුත් තැපැලට යොමු කිරීමෙන් දැනුම් දිය හැකි අතර, ඒ පිළිබඳව අප බැංකුව විසින් ඔබ වෙත ක්ෂණිකවම ප්‍රතිචාර දක්වන්නෙමු.

| **ගිණුම පිළිබඳ විස්තරය** | **බැංකු ගණුදෙනුකරුවන්ට අත්වන වාසි** | **ගාස්තු වර්ග සහ බැංකුව විසින් පනවන වෙනත් අයකිරීම්** | **ගිණුම විවෘත කිරීම පිණිස අනුගමනය කළයුතු කාර්ය පටිපාටි** | **ප්‍රධාන නියමයන් සහ කොන්දේසි** |
|---|---|---|---|---|
| **ඇ) ඉතිරි කිරීමේ ගිණුම්** | | | | |
| **නේෂන්ස් ටැක්ස් ප්ලෑන ඉතිරි කිරීමේ ගිණුම (Nations Tax Planner Savings Account)**<br>මෙම ගිණුම පොලියක් ජනනය වන ගිණුමකි. බැංකුව විසින් බැංකු ගණුදෙනුකරු මනාපය දක්වන පරිදි තැපැල් මගින් හෝ විද්‍යුත් තැපැල හරහා බැංකු ගණුදෙනුකරු වෙත කාර්තුගත බැංකු ප්‍රකාශ නිකුත් කරනු ලැබේ. | • රුපියල් 2,000 ට වැඩි ශේෂයන් සඳහා 2.5% ක පොලී අනුපාතය.<br>• අන්තර්ජාල සහ ජංගම දුරකථන බැංකුකරණය.<br>• බදු ගෙවීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවීම් නියෝග නිකුත් කිරීම වෙනුවෙන් 50%ක ගාස්තු අත්හැරීම.<br>• අවම ශේෂයක් පවත්වාගෙන යාමේ නියමයක් නොමැත. | රුපියල් 100% ක වාරික ප්‍රේෂණය නොකිරීම වළක්වා ගැනීම පිණිස අවම වශයෙන් රුපියල් 2,000/-ක මුදලක් මාසික පදනමක් මත නේපන්ස් ටැක්ස් ප්ලෑන ඉතිරි කිරීමේ ගිණුමට (Nations Tax Planner Savings Account) මාරුකිරීම/පැවරීම කළ යුතුය. | ඉතිරි කිරීමේ ගිණුමක් විවෘත කිරීම සඳහා වන බැංකුවේ සම්මත ගිණුම් විවෘත කිරීමේ ආකෘති පත්‍රය සම්පූර්ණ කොට පහත සඳහන් ලියකියවිලි ද සමග බැංකුවේ ඕනෑම ශාඛාවක් වෙත භාරදිය යුතුය.<br>• වලංගු ජාතික හැඳුනුම්පතේ / වලංගු ගමන් බලපත්‍රයේ පිටපතක්.<br>• පදිංචි ලිපිනය ජාතික හැඳුනුම්පතේ හෝ ගමන් බලපත්‍රයේ ලිපිනයෙන් වෙනස් වන විටක දී, ලිපිනය තහවුරු කරගැනීම පිණිස ලේඛනමය සාක්ෂි අවශ්‍ය වේ. | • සුදුසුකම් ලබන තැනැත්තන්:<br>වයස අවුරුදු 18 ට වැඩි, ශ්‍රී ලංකාවේ පදිංචි, වලංගු ජාතික හැනුම්පතක් / වලංගු ගමන් බලපත්‍රයක් හිමි ශ්‍රී ලාංකිකයෙකු වීම.<br>• අවම ආරම්භක තැන්පතුව රුපියල් 2,000/-කි.<br>• බැංකුවේ තනි අභිමතය පරිදි සිදුකරන ප්‍රතිශෝධනයකට යටත්ව සහ බැංකුව විසින් කලින් කලට තීරණය කරන අනුපාතයකට පොලිය උපචිත වේ.<br>• ගිණුමට බැරකරන, දෛනිකව තිබෙන ශේෂය පදනම් කරගෙන මාසය අවසානයේ දී, පොලිය ගණනය කරනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| **නේෂන්ස් ටැක්ස් ප්ලෑන ජංගම ගිණුම (Nations Tax Planner Current Account)**<br>මෙම ගිණුම පොලියක් ජනනය නොවන ගිණුමක් වන අතර, බැංකුව විසින් ජනනය කරන ගිණුමකි. මෙම ජංගම ගිණුම සඳහා බැංකු අයිරා සහ sweep පහසුකම් සපයනු නොලැබේ. | • චෙක් පොත<br>• අන්තර්ජාල සහ ජංගම දුරකථන බැංකුකරණය.<br>• මාසික බැංකු ප්‍රකාශ | • රුපියල් 100% ක වාරික ප්‍රේෂණය නොකිරීම වළක්වා ගැනීම පිණිස අවම වශයෙන් රුපියල් 2,000/-ක මුදලක් මාසික පදනමක් මත නේපන්ස් ටැක්ස් ප්ලෑන ඉතිරි කිරීමේ ගිණුමට (Nations Tax Planner Savings Account) මාරුකිරීම/පැවරීම කළ යුතුය.<br>• රුපියල් 1,000 ක සේවා ගාස්තුවක් වළක්වා ගැනීම පිණිස රුපියල් 10,000 ක අවම ශේෂයක් ජංගම ගිණුමේ පවත්වා ගෙන යා යුතුය. | ජංගම ගිණුමක් විවෘත කිරීම සඳහා වන බැංකුවේ සම්මත ගිණුම් විවෘත කිරීමේ ආකෘති පත්‍රය සම්පූර්ණ කොට හඳුන්වා දීමේ අවශ්‍යතාවන් සමග පහත සඳහන් ලියකියවිලි ද අමුණා බැංකුවේ ඕනෑම ශාඛාවක් වෙත භාරදිය යුතුය.<br>• ජාතික හැඳුනුම්පතේ / වලංගු ගමන් බලපත්‍රයේ පිටපතක්.<br>• පදිංචි ලිපිනය ජාතික හැඳුනුම්පතේ හෝ ගමන් බලපත්‍රයේ ලිපිනයෙන් වෙනස් වන විටක දී, ලිපිනය තහවුරු කරගැනීම පිණිස ලේඛනමය සාක්ෂි අවශ්‍ය වේ. | • සුදුසුකම් ලබන තැනැත්තන්:<br>වයස අවුරුදු 18 ට වැඩි, ශ්‍රී ලංකාවේ පදිංචි, වලංගු ජාතික හැඳුනුම්පතක් / වලංගු ගමන් බලපත්‍රයක් හිමි ශ්‍රී ලාංකිකයෙකු වීම.<br>• අවම ආරම්භක තැන්පතුව රුපියල් 2,000/-කි. |